## ACNC මගින් කුමක් කරයිද?

ACNC මගින් පහත දේ කරයි:

- 'පුණ්‍යායතන' ලියාපදිංචි කිරීම (පුණ්‍ය යන්නෙහි නෛතික අර්ථය භාවිතා කිරීම-මහජනතාවගේ ප්‍රතිලාභය සඳහාවූ (පුද්ගලික නොවන) පුණ්‍ය අරමුණක් සහිත ලාභ නොලබන ආයතනයක්)
- පුණ්‍යායතන හට තොරතුරු, මාර්ගෝපදේශ, උපදෙස් සහ උපකාර ලබාදීම මගින් සිය වගකීම් අවබෝධ කර ගැනීමට උපකාර කිරීම
- ඕස්ට්‍රේලියාවේ ඇති සියළුම ලියාපදිංචි කල පුණ්‍යායතන සම්බන්ධයෙන් නොමිළේ සොයාගත හැකි මාර්ගගත රෙජිස්ටරයක් පවත්වාගෙන යාම
- අනවශ්‍ය පරිපාලන සීමාවන් අඩු කිරීම සඳහා 'වරක් වාර්තා කිරීම, නිතර භාවිතා කිරීම' ආකාරයේ වාර්තා කිරීමේ රාමුවක් වර්ධනය කිරීම, කොමන්වෙල්ත් සහ ප්‍රාන්ත රජයන් සහ ටෙරිටරි රජයන් සහ ඒජන්සි සමඟ එක්ව කටයුතු කිරීම
- පුණ්‍යායතන සම්බන්ධ පැමිණිලි සොයා බැලීම, උදාහරණ වශයෙන් වංචාව සහ දරුණු වැරදි පාලනය සම්බන්ධ කරුණු

## ACNC මගින් නොකරන දේ මොනවාද?

ACNC මගින් පුණ්‍යායතන නොවන NFP පාලනය නොකරයි. තවද, අපගේ වගකීම්වලට යටත් නොවන පුණ්‍යායතන සම්බන්ධ ගැටළු මතුකර ඇත. උදාහරණ වශයෙන්, මහජන විශ්වාසය සහ විශ්වසනීය බවට තර්ජනය වන දරුණු අවස්ථාවලදී හැර සාමාන්‍ය වශයෙන් පුණ්‍යායතනයක අභ්‍යන්තර මතභේද අප විසින් විමර්ශනය කරන්නේ නැත.

## වැඩිදුර තොරතුරු සහ උපකාර

ACNC සම්බන්ධයෙන් සහ ඔබගේ පුණ්‍යායතනය සමග අපි කටයුතු කරන අකාරය සොයා ගැනීමට ආකාර කිහිපයක් ඇත:

- ACNC වෙබ් අඩවිය වෙත acnc.gov.au ඔස්සේ පිවිසෙන්න
- 13 ACNC (13 22 62) ඔස්සේ දූරකථනයෙන් අමතන්න
- advice@acnc.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යවන්න
- Advice Services, ACNC, GPO Box 5108, Melbourne VIC 3001 වෙත ලියන්න, නැතිනම්
- 1300 232 569 ඔස්සේ ෆැක්ස් පණිවුඩයක් එවන්න

අපගේ වෙබ්අඩවිය ඔස්සේ ඊමේල් මගින් අළුත් තොරතුරු ලබාගැනීමට අත්සන් කරන්න, නැතිනම් ෆේස්බුක් හෝ ට්විටර් හි තොරතුරු බලන්න.

### සමාජ මාධ්‍යයන්:

ට්විටර් acnc_gov_au

යූටියුබ් acncvideos

ෆේස්බුක් acnc.gov.au

### පරිවර්තන සහ තෝල්ක සේවාව සහ ජාතික රිලේ සේවාව:

TTY - 13 36 77 අමතා 13 22 62 හා කථා කිරීමට ඉල්ල සිටින්න
කථාකර සවන් දෙන්න - 1300 555 727 අමතා 13 22 62 ඉල්ලා සිටින්න

TIS - 13 14 50 අමතා භාෂා පරිවර්තකයෙකු හට 13 22 62 අමතන ලෙස ඉල්ලා සිටින්න

Australian Government

Australian Charities and Not-for-profits Commission



# ඔබ ලාභ සඳහා නොවන ආයතනයක් (NOT-FOR-PROFIT) පවත්වාගෙන යන්නේද?

එය ලියාපදිංචිකල පුණ්‍යායතනයක් විය හැකිය

acnc.gov.au

## පුණ්‍යායතන සහ ලාභ සඳහා නොවන ආයතන සඳහාවූ ඕස්ට්‍රේලියානු කොමිසම (Australian Charities and Not-for-profits Commission (ACNC)) ඕස්ට්‍රේලියාවේ පුණ්‍යායතන සඳහාවූ ස්වාධීන නියාමක ආයතනයයි. වැඩිපුරම ලාභ සඳහා නොවන ආයතන (not-for-profits (NFPs)) පුණ්‍යායතන නොවුවද ඔබගේ ආයතනය ACNC සමඟ ලියාපදිංචි කර ඇතිනම්, පුණ්‍යායතනයක් විය හැකිය.

ඔබගේ NFP එසේ වන බවට ඔබ නොසිතුවද, එය ACNC සමඟ පුණ්‍යායතනයක් ලෙස ලියාපදිංචි කර තිබිය හැකිය. 2012 දෙසැම්බර් 3 වන දින ACNC ආරම්භවීමට පෙර ඔබගේ ආයතනයට පුණ්‍යායතන සඳහාවූ බදු සහන ලැබුණාද? එසේනම්, එය ඕස්ට්‍රේලියානු බදු කාර්යාලය (Australian Taxation Office (ATO)) මගින් පුණ්‍යායතනයක් ලෙස පිළිගෙන ඇති අතර අප සමඟ ස්වයංක්‍රීයවම ලියාපදිංචි වී තිබිය යුතුය.

> **!** acnc.gov.au/findacharity යන වෙබ්අඩවිය ඔස්සේ ඔබගේ ආයතනය එම නමින් හෝ ඕස්ට්‍රේලියානු ව්‍යාපාර අංකය (Australian Business Number (ABN)) මගින් ACNC රෙජිස්ටරයේ සොයා බලන්න.

## ඔබගේ NFP ලියපදිංචි පුණ්‍යායතනයක්ද?

ඔබගේ NFP, ACNC රෙජිස්ටරයේ ඇතිනම්, එය ලියාපදිංචි පුණ්‍යායතනයකි. එය එහි නැතිනම්, සහ ඔබ සිතන ආකාරයට එය එම ලේඛණයේ තිබිය යුතුනම්, කරුණාකර අප හා සම්බන්ධ වන්න.

එය ලියාපදිංචිවී නොමැතිනම්, එය ලියාපදිංචිය සඳහා අයදුම් කල හැකිද යන්න තීරණය කරන්න. ලියාපදිංචිවී තිබීම මගින් ප්‍රතිලාභ ලැබෙන අතර (පුණ්‍යායතන සඳහාවූ කොමන්වෙල්ත් බදු සහන ඇතුළුව) එය ස්වේච්ඡාවෙන් කරන දෙයකි.

## ලියාපදිංචි පුණ්‍යායතන කල යුත්තේ කුමක්ද?

### තොරතුරු පරීක්ෂා කර බලන්න

පළමුවෙන්ම, ACNC සතුව ඔබගේ වර්තමාන ඊමේල් ලිපිනය ඇතිදැයි බලන්න. ඔබ විසින් අනවශ්‍ය බව පැවසුවොත් මිස මෙම ලිපිනය ඔබ වෙත විධිමත් ලියකියවිලි යැවීමට උපකාර කරගනී.

### වාර්ෂික තොරතුරු ප්‍රකාශනයක් යැවීම මගින් වාර්තා කිරීම කරන්න

ලියාපදිංචි පුණ්‍යායතන මගින් සෑම වසරකදීම වාර්ෂික තොරතුරු ප්‍රකාශනයක් ACNC වෙත යැවීම කල යුතුය. මෙය සිය වාර්තා කිරීමේ කාලසීමාව අවසානවී මාස හයක් ඇතුලත කල යුතුය.

ඔබගේ පුණ්‍යායතනයේ වාර්තා කිරීමේ කාලසීමාව පරීක්ෂා කර බැලීම මගින් මෙය ලබාදිය යුතු දිනය කුමක්ද යන්න දැනගන්න. එය ජූලි 1 දින සිට ජූනි 30 අතර කාලයේ නොවේනම්, ඔබ විසින් ඒ බව අපට දැන්විය යුතුය.

වාර්ෂික තොරතුරු ප්‍රකාශනය මගින් ඔබගේ පුණ්‍යයතනය මගින් පසුගිය මුදල් වර්ෂයේ කලදේ, එහි ක්‍රියාකාරිත්වය මගින් ප්‍රජාවට උපකාර කල ආකාරය සහ එහි මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් විමසා සිටී. ඔබ විසින් ලබාදිය යුතු තොරතුරු ප්‍රමාණය තීරණය වන්නේ ඔබගේ පුණ්‍යායතනයේ ප්‍රමාණය අනුවය.

### ACNC රෙජිස්ටරය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්න

ACNC රෙජිස්ටරය යනු ACNC සමඟ ලියාපදිංචි වී ඇති සියළුම පුණ්‍යායතන මහජනතාව හට නොමිළේ සොයාගත හැකි මාර්ගගත දත්ත පද්ධතියකි. ඔබගේ පුණ්‍යායතනය මෙම රෙජිස්ටරයේ ඇතිනම්, මහජනතාව (අනාගතයේදී ආධාර කිරීමට බලාපොරොත්තුවන සහ ස්වේච්ඡා සේවකයන් ඇතුළුව) හට එහි පුණ්‍ය අරමුණ, මේ මගින් ප්‍රතිලාභ ලබන අය සහ එය ක්‍රියාත්මක වන ස්ථානය ආදී සාමාන්‍ය තොරතුරු සොයාගත හැකිවේ.

ACNC රෙජිස්ටරයේ පුණ්‍යායතන මගින් වාර්ෂික තොරතුරු ප්‍රකාශනයේ ඇතුලත් කරන ලද තොරතුරු මෙන්ම එය පරිපාලනය කරන සහ වාර්ෂික වාර්තා වැනි වෙනත් ලියකියවිලිද අන්තර්ගතවේ. ඔබගේ පුණ්‍යායතනය සම්බන්ධ සමහර තොරතුරු පල නොකරන ලෙස ඉල්ලා සිටීමට ඔබට හැකිය.

### පුණ්‍යායතනයේ වෙනස්කම් සම්බන්ධයෙන් ACNC වෙත දැනුම් දෙන්න

ලියාපදිංචිවී සිටින අතර ඔබගේ පුණ්‍යායතනය සම්බන්ධ මූලික වෙනස්කම් සිදුවුවහොත්, (එහි නම සහ එය පාලනය කර අයගේ නම් ආදී) නිශ්චිත කාලසීමාවකදී ACNC වෙත දැනුම් දිය යුතුය. ඔබගේ පුණ්‍යායතනය සම්බන්ධ තොරතුරු මාර්ගගතව, ACNC හි පුණ්‍යායතන පෝර්ටලය ඔස්සේ charity.acnc.gov.au යන වෙබ් අඩවියේ යාවත්කාලීන කල හැකිය.

### ලියාපදිංචිය සම්බන්ධ සුදුසුකම පවත්වා ගන්න

පහත ආකාරයට ඔබගේ පුණ්‍යායතනය ACNC සමඟ ලියාපදිංචිය සඳහා සුදුසුකම් පවත්වා ගනු ලබන බවට වග බලා ගන්න:

- ලාභ නොලබන ආයතනයක් වශයෙන් දිගටම සිටීම
- පොදු යහපත සඳහාවූ පුණ්‍ය අරමුණක් තිබීම
- පාලනය සම්බන්ධ සම්මතයන් අනුව කටයුතු කිරීම
- ත්‍රස්තවාදී හෝ වෙනත් අපරාධ ක්‍රියාකාරකම් හා සම්බන්ධ නොවීම.

> acnc.gov.au යන වෙබ්අඩවියේ 'Manage my charity' (මාගේ පුණ්‍යායතනය පාලනය කිරීම) ඔස්සේ ලියාපදිංචි පුණ්‍යායතන සඳහාවූ දිගින් දිගට ඇති වගකීම් සම්බන්ධ වැඩිදුර විස්තර සොයා දැන ගන්න.

## වෙනත් නියාමක ආයතනයන් සඳහාවූ වගකීම්

ප්‍රාන්ත රාජ්‍ය සහ ටෙරිටරි සමාගම්ගත කල සමිති නියාමකයන් වැනි වෙනත් නියාමක ආයතන සම්බන්ධයෙන් පුණ්‍යායතන සඳහා තව දුරටත් වගකීම් තිබිය හැකිය. ACNC මගින් වාර්තා කිරීම සහ අනවශ්‍ය පරිපාලන සීමාවන් අඩු කිරීමට කටයුතු කරමින් සිටී. උදාහරණ වශයෙන්, වෙනත් ආයතන වෙත ලබාදුන් වාර්තා පිළිගැනීම.

> acnc.gov.au යන වෙබ්අඩවියේ 'Red tape reduction' (අනවශ්‍ය පරිපාලන සීමාවන් අඩු කිරීම) ඔස්සේ අප කරන කටයුතු සම්බන්ධ වැඩිදුර විස්තර සොයා දැන ගන්න.

## ACNC හි නියාමක ප්‍රවේශය

පුණ්‍යායතන හා සම්බන්ධ බොහෝ අය අවංක අතර නිවැරදි දෙය කිරීමට උත්සාහ කරන අය බව ACNC අවබෝධයෙන් සිටී. අපගේ ප්‍රවේශය ආරම්භ වන්නේ අධ්‍යාපනය සහ උපකාර කිරීම අවධාරණය කිරීම මතය.

දරුණු ලෙස කරන වැරදි පරිපාලනය, දරුණු ලෙස මුදල් වැරදි ලෙස භාවිතා කිරීම හෝ ACNC පනත දරුණු ලෙස උල්ලංඝනය කිරීම වැනි දේ සම්බන්ධ සාක්ෂි ඇති අවස්ථාවල අප විසින් ක්ෂණිකව සහ තදින් කටයුතු කරනු ඇත.